# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

# කොළඹ

## <u>පුවත්පත් නිවේදනය</u>

**ලංකා වතු කම්කරුවන්ගේ අධ්‍යාපන භාරය (CEWET) විසින්** ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා වතු කම්කරුවන්ගේ දරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ශිෂ්‍යත්ව අ.පො.ස උසස් පෙළ, උපාධි පාඨමාලා සහ ශ්‍රී ලංකාවේ වෙනත් රජයේ තාක්ෂණික විද්‍යාලවල කාර්මික/ වෘත්තීය අධ්‍යාපනය ලබන සිසුන් සඳහා පිරිනමනු ලැබේ.

අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් වූ සිසුන්ට (අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ 6 ක් සහිතව) හෝ උසස් පෙළ සමත් වූ සිසුන්ට සහ වයස අවුරුදු 25 ට අඩු පුද්ගලයන්ට මෙම ශිෂ්‍යත්වය සඳහා අයදුම් කළ හැක. සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමඟ උප්පැන්න සහතිකයේ, අ.පො.ස සාමාන්‍ය පෙළ හා අ.පො.ස. උසස් පෙළ ප්‍රතිපල පත්‍රයේ, දෙමව්පියන්ගේ වත්කම් වැටුප් පත්‍රයේ, දෙමාපියන්ගේ රැකියාව පිළිබඳ වතු අධිකාරීගේ සහතිකයේ සහ යාවත්කාලීන කරන ලද බැංකු පොතේ ඡායා පිටපත් එවිය යුතුය. අයදුම්පත් කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ www.hcicolombo.gov.in යන වෙබ් අඩවියෙන් බාගත හැකිය.

ඒසේම අයදුම්පත් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය, 36-38, ගාලු පාර, කොළඹ -03 සහ ඉන්දියානු සහකාර මහ කොමසාරිස් කාර්යාලය, අංක 42, හිල්පන්කඳුර මාවත, අම්පිටිය පාර, මහනුවර යන ලිපිනයන්ගෙන්ද ලබා ගත හැකිය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ගරු ලේකම්, ලංකා වතු කම්කරුවන්ගේ අධ්‍යාපන භාරය, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

භාරේ,  තැපැල් පෙට්ටිය 882, කොළඹ -03 යන ලිපිනයට 2024 අප්‍රේල් 29 දිනට හෝ ඊට පෙර ලැබීමට සලස්වන්න.

****

***කොළඹ***

***2024 අප්‍රේල් 29***